**ගොවීන්ගේ භාරකාර අරමුදල - 2022**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1994 මාර්තු 9 දිනැති ගොවීන්ගේ භාරකාර අරමුදලේ භාරකාර ඔප්පුවෙහි විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1. කරුණු අවධාරණය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 1.10 මඟින් හෙළිදරව් කර ඇති පරිදි ගොවිසෙත ලොතරැයි ආදායමෙන් සියයට 10 ක ප්‍රමාණයක් 1995 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද සමුච්චිත එකතුව රු.6,367,303,383 ක් වුවත් භාර ඔප්පුවක් මඟින් ස්ථාපිත කර ඇති අරමුදලට වර්ෂ 28 ක කාලය තුළදී ගොවීන්ගේ භාරකාර අරමුදලේ කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට ලබා දී තිබුණේ රු.955,605,390 ක මුදලක් පමණි. | ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ගොවීන්ගේ භාරකාර අරමුදල නමින් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද ගොවිසෙත ලොතරැයි ආදායමින් 1995 වර්ෂයේ සිට 2008 වර්ෂය සඳහා අරමුදල වෙත මුදල් ලබා දී ඇති අතර 2008 වර්ෂයෙන් පසුව අවසන් වතාවට මුදල් ලැබී ඇත්තේ 2021 වර්ෂයේදීය. අරමුදල විසින් කිහිපවතාවකදීම අරමුදල් ඉල්ලුම් කොට ඇතත් අදාළ මුදල් ලැබී නොමැත. අවසන් වරට 2023 වර්ෂයේදී ද මුදල් ඉල්ලා ලිපි යොමු කර ඇති අතර 2023 වර්ෂයේදී රු.මි. 250 ක මුදලක් ලබා දී ඇත. | ගොවිසෙත ලොතරැයි ආදායම උපරිම කාර්යක්ෂමතාවය කින් භාවිතා කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 හි 9 ඡේදය ප්‍රකාරව මාස 3 කට අඩු කාලයකින් කල් පිරෙන අවස්ථාවලදී, ආයෝජනයක් මුදල් හා සමාන දෑ ලෙස සුදුසුකම් ලබන නමුත් මාස 3 කට අඩු කාලයකින් කල් පිරෙන රු.200,000,000 ක ස්ථාවර තැන්පතු, දිගුකාලීන මූල්‍ය වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබීම හේතුවෙන් එදිනට මුදල් හා මුදල් සමාන දෑවල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී කාලසීමාව අනුව ආයෝජන කෙටිකාලීන හා දිගුකාලීන ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 41 ඡේදය ප්‍රකාරව ඇස්තමේන්තුවක වෙනස්වීමේ බලපෑම වෙනස සිදු වූ | ඉදිරියේදී ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. අංක 03 පරිදි ගිණුම්ගත කිරීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාලපරිච්ඡේදයට සහ ඉදිරි කාලපරිච්ඡේදවලට බලපාන පරිදි ගැළපිය යුතු වුව ද පෙර වර්ෂයේ අධි බදු වෙන් කිරීම් රු.23,997,934 ක් ප්‍රවර්තන වර්ෂයේ බදු වියදමට නොගළපා සමුච්චිත අරමුදලට ගළපා තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 ප්‍රකාරව ස්ථාවර වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් වත්කම් පන්ති 3 ක පිරිවැය රු.1,104,971 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධන කර මූල්‍ය ප්‍රකාශනවල ගැළපීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රත්‍යගණන කමිටු වාර්තාව 2022 දෙසැම්බර් 31 දින වන විට අරමුදල වෙත නොලැබීම හේතුවෙන් මෙය මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීමට නොහැකි වී ඇත. 2023 වර්ෂයේදී ප්‍රත්‍යාගණන වාර්තාව ලබාගෙන අදාළ ගැලපීම් සිදු කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

**1.5.3. ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයට පෙර වර්ෂවල සිට පවතින රු.11,963,430 ක් වූ ආදායම් බදු අධි වෙන් කිරීම මූල්‍ය ප්‍රකාශනවල නොගැළපීම නිසා ගෙවිය යුතු ආදායම් බදු වගකීම එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්වා තිබුණි. | මෙම ශේෂය ගොවීන්ගේ භාරකාර අරමුදල බදු ගෙවීම් සඳහා ලියාපදිංචි වීමට පෙර සිට වෙන් කරන ලද ශේෂයන් වන අතර මෙම ශේෂය ගිණුම් තුළින් ඉවත් කිරීමට කටයුතු කරමි. | නිවැරදි බදු වගකීම අනාවරණය කළ යුතුය. |
| (ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස දක්වා ඇති රු.7,241,656 ක් වූ ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය සත්‍ය වශයෙන්ම පවතින ශේෂයක් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | 2002 වර්ෂයේදී චක්‍රීය අරමුදල හා කෘෂිකාර්මික භාරකාර අරමුදල ඒකාබද්ධ කිරීමේදී ගොවීන්ගේ භාරකාර අරමුදල වෙත පවරන ලද මෙම ශේෂය පොත් අගයක් පමණි. මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කර ඇත. | බැංකු ශේෂය පිළිබඳ පරීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් තුළ පවතින පෙර වර්ෂවල සිට පැවත එන රු.1,193,727 ක වෙනත් ලැබිය යුතු පොලී ශේෂය, රු.18,247,914 ක කෙටිකාලීන ණය ශේෂය සහ භාරකාර අරමුදල පිහිටුවීමේදී පවරා ගෙන තිබුණු රු.9,112,579 ක් වූ දිගු කාලීන ණය ශේෂය නොපවතින හෝ අයකර ගැනීමේ හැකියාවක් නොමැති ශේෂ බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | රු.1,193,727 ක ශේෂය පොත්වලින් ඉවත් කිරීමට ඉදිරියේ දී කටයුතු කෙරෙනු ඇත.<br>රු.18,247,914 ක ශේෂයෙන්<br>• රු.1,424,521 ක ශේෂයක් ගොවිජන විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.<br>• මුළු එකතුව රු.8,623,393 ක් වූ ශේෂ දෙකක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි කමිටුවක් පත් කර ඉදිරි කටයුතු කිරීමට යෝජිතය.<br>• රු.8,200,000 ක ශේෂයට අදාළ සමාගම් | අය කර ගත නොහැකි ණය ශේෂවල සම්පූර්ණ වටිනාකම සඳහා මූල්‍ය ප්‍රකාශනවල අඩමාණ ණය ප්‍රතිපාදන ඇති කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | 3 කට එරෙහිව නීතිමය කටයුතු කිරීමට යෝජිතය.<br>රු.9,112,579 ක ශේෂය සඳහා කමිටුවක් පත් කර එහි නිර්දේශ මත කටයුතු කිරීමට යෝජිතය. | |
| (ඈ) | උපචිත පදනමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දක්වා තිබුණද එයට පටහැනිව ගොවිසෙත ලොතරැයි ආදායමෙන් භාරකාර අරමුදලේ ආදායමක් ලෙස මහා භාණ්ඩාගාරයට බැර කර ඇති ආදායම් මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි. | 2016 වර්ෂයේ සිට සත්‍ය වශයෙන් අරමුදලට ලද ආදායම පමණක් ගිණුම්ගත කොට ලැබිය යුතු මුදල සටහනක් මගින් පමණක් පෙන්නුම් කරන ලදී. | ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.14,171,883 ක් වූ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම මූල්‍ය ප්‍රකාශන තුළ රු.12,953,578ක් ලෙස සටහන් කිරීම නිසා සමාලෝචිත වර්ෂයට අදාළ පොලී ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු.1,218,305 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයට අදාළ භාණ්ඩාගාර බිල්පත් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීමේදී ආයෝජනයේ මුල් මුදල අනුව ගිණුම් ගත කර ඇත. පූර්ව වර්ෂය සහ සමාලෝචිත වර්ෂය අතර භාණ්ඩාගාර බිල්පත් ආයෝජිත වටිනාකම් අතර වෙනස්වීම වර්ෂ අවසානයේදී ජ'නල් සටහනක් මගින් ගලපා ඇත. ගිණුම් ප්‍රමිති ප්‍රකාරව ඉදිරියේදී උපචිත පදනම මත ගිණුම්ගත කිරීමට සටහන් කර ගතිමි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව පොලී ආදායම ගිණුම් තැබීම කළ යුතුය. |
| (ඊ) | පසුගිය වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද පෙර වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම රු.2,343,543 ක් වැඩියෙන් සටහන් කිරීමේ වරද නිවැරදි කිරීමේදී රු.1,125,192 ක් සඳහා පමණක් ගැලපීම් කර තිබුණු අතර තවදුරටත් රු.1,218,351 ක් ගැලපීම් කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසාන ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලී ශේෂය වැඩියෙන් සටහන් වීමේ වරද නිවැරදි කිරීම සඳහා ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් වටිනාකම රු.1,125,192 ක් පූර්ව වර්ෂ ගැලපුම් ගිණුමට ගැලපීමක් සිදු කර ඇත. මෙම ගැලපීම මගින් 2022 වර්ෂයේ අවසාන ශේෂය නිවැරදිව පිළිබිඹු වන අතර ඉදිරියේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති 03 පරිදි සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශනවල සටහන් තුළ සහ සටහන් මගින් නිරූපණය කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව පොලී ආදායම ගිණුම් තැබීම කළ යුතුය. |
| (උ) | පසුගිය වර්ෂයේ ලබාදෙන ලද අත්තිකාරම් මුදල් පියවීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කර තිබුණු රු.6,029,902 ක් වූ වියදම් වවුචර් ඉකුත් වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය රු.6,029,902 ක් වැඩියෙන් දක්වා තිබුණි. | සංවර්ධන කටයුතු සඳහා ලබාදෙන අත්තිකාරම් මුදල් අදාළ වර්ෂයේ අත්තිකාරම් ලෙස ගිණුම්ගත කරන අතර පූර්ව වර්ෂ ගැලපුම් ලෙස ගලපනු ලබයි. | අත්තිකාරම් මුදල් පියවීම් කරන ලද කාලච්ඡේදයට අදාළව වියදම හඳුනාගත යුතුය. |
| (ඌ) | 2020 වර්ෂයේ ආදායම රු.229,069 ක් 2021 වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කිරීමේ දෝෂය නිවැරදි කිරීම සඳහා 2022 වර්ෂයේදී ගැලපිය යුතු නොවුණ නමුත් එය සමුච්චිත | 2022 වර්ෂයට අදාළ බඩඉරිඟු ණය පොලී ආදායම ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමේදී ලැබිය යුතු පොලී ආදායම් ගිණුමෙන් අඩු කිරීමේ වරද මෙම වර්ෂයේදී නිවැරදි කරමි. | ගිණුම්කරණ දෝෂය නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අරමුදලට හර කර සදොස් ලෙස 2022 වර්ෂයේ ලැබිය යුතු බඩ ඉරිඟු ණය පොලී ගිණුමට බැර කර තිබුණි. | | |
| (එ) | පෙර වර්ෂ ගැලපුම් ගිණුමේ රු.16,555,081 ක බැර ශේෂය සමුච්චිත අරමුදලේ ආරම්භක ශේෂයට එකතු කර දැක්වීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට එකතු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 අනුව ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය තුළ පූර්ව වර්ෂ ගැලපුම් දැක්වීමේදී පෙර වර්ෂයේ සමුච්චිත අරමුදලට ගැලපීම් කිරීමට සටහන් කර ගනිමි. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01දිනට සමුච්චිත අරමුදලේ ශේෂය, අදාළ ලෙජර් ගිණුමෙහි රු.1,457,360,303 ක් සහ හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනයෙහි රු.1,425,935,517 ක් ලෙස දක්වා තිබුණු අතර රු.31,424,786 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී අදාළ අතපසුවීම් හා දෝෂ නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | වෙනස නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | කෘෂිශක්ති ණය යෝජනාක්‍රමයේ පොලී ආදායමට අදාළ ලෙජර් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ අතපසුවීම් හා දෝෂ නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | ලෙජර ගිණුමක් සකස් කළ යුතුය. |

### 1.5.4. නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ගොවිසෙත ලොතරැයි ආදායම | 5,411,697,993 | 5,400,175,527 | 11,522,466 | අදාළ වෙනස මහාභාණ්ඩාගාරයෙන් සහ ජාතික ලොතරැයි මණ්ඩලයෙන් විමසා නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

### 1.5.5. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ගොවීන්ගේ තැන්පතු | 697,644 | විස්තරාත්මක උපලේඛන සහ ශේෂ සනාථ කිරීම. | මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ පොත් අගයක් පමණක් ඇත. විස්තරාත්මක උපලේඛන නොමැත. ශේෂ සනාථ කර ගැනීමට පාර්ශවයක් නොමැත. | නොපමාව ශේෂ සනාථ කිරීම කළ යුතුය. |
| (ආ) | කොටස් ගිණුමේ ශේෂය | 591,965 | කොටස් සහතිකය | මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ පොත් අගයක් පමණක් ඇත. විස්තරාත්මක උපලේඛන නොමැත. ශේෂ සනාථ කර ගැනීමට පාර්ශවයක් නොමැත. | නොපමාව ශේෂ සනාථ කිරීම කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ගොවිසෙත අරමුදල් ශේෂය | 159,399,408 | විස්තරාත්මක උපලේඛන සහ ශේෂ සනාථ කිරීම | මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ පොත් අගයක් පමණක් ඇත. විස්තරාත්මක උපලේඛන නොමැත. ශේෂ සනාථ කර ගැනීමට පාර්ශවයක් නොමැත. | නොපමාව ශේෂ සනාථ කිරීම කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 15.1 ඡේදය | මූල්‍ය විනය පවත්වා ගැනීම සඳහා විසර්ජන පනතින් අනුමත නොකර අයවැයට පරිබාහිරව ආදායම් රැස්කිරීම හා වියදම් දැරීම අනුමත නොකළ යුතු වුවත්, 1994 මාර්තු 09 දිනැති ගොවීන්ගේ භාරකාර ඔප්පුව මඟින් ස්ථාපිත කර ඇති මෙම අරමුදල පාර්ලිමේන්තුවේ අනුමැතියකින් තොරව මෙම වාර්තාවේ දිනය වන විටත් ක්‍රියාත්මක වනු ලබයි. | ගොවිභාරකාර අරමුදලේ පනත් කෙටුම්පත සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීම අමාත්‍යාංශයේ නීති අංශය වෙත යොමු කර ඇත. එමගින් ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | පනත, කඩිනමින් පාර්ලිමේන්තුවෙහි සම්මත කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 40 වගන්තිය | අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරගත යුතු වුවත් භාරකාර අරමුදල විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරගෙන නොතිබුණි. | ගොවීන්ගේ භාරකාර අරමුදල කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනය විසින් විගණනයට ලක් කෙරේ. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය අරමුදලේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි. | අභ්‍යන්තර විගණනක වරයෙකු පත්කර ගත යුතුය. |
| (ඇ) | 1994 මාර්තු 9 දිනැති ගොවීන්ගේ භාරකාර අරමුදලේ භාරකාර ඔප්පුව 14 වගන්තිය | භාරකාර අරමුදල සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අනුමත කර ගෙන නොතිබුණි. | ගොවි භාරකාර අරමුදලේ පනත් කෙටුම්පත සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීම අමාත්‍යාංශයේ නීති අංශය වෙත යොමු කර ඇත. අදාළ පනත් කෙටුම්පත සම්මත වූ පසු බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අනුමත කරවා ගැනීමට කටයුතු කරමි. | කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කරවාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.48,833,512 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.74,034,655 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.25,201,143 ක අඩු වීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීම සඳහා පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයෙන් ගොවිසෙත ලොතරැයි ආදායම් ලැබී නොතිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ලාභය අඩු වී තිබුණ ද පොලී ආදායම රු.47,547,192 ක වැඩිවීමක් එනම් පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස සියයට 141 කින් වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර 2022 ජුනි 09 වන දින කල් පිරුණු රු.125,000,000 ක් වූ ආයෝජනය, නැවත ආයෝජනය කිරීමට දින 7 ක් ප්‍රමාද කිරීම හේතුවෙන් එදිනට පැවති සියයට 23.25 ක වාර්ෂික පොලී අනුපාතය මත රු.557,363 ක පොලී මුදලක් අහිමි වී තිබුණි. | ආයෝජනයන් කල්පිරෙන දින හා රජයේ නිවාඩු දින සමග නොවැළැක්විය හැකි ඇතැම් කරුණු මත ප්‍රමාදවීම් සිදුවී ඇත. කෙසේ නමුත් ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව අදාළ ආයෝජන සිදු කිරීමට සටහන් කර ගතිමි. | අතිරික්ත අරමුදල් අප්‍රමාදව ආයෝජනය කළ යුතුය. |
| (ආ) | 2002 සිට 2004 දක්වා අවස්ථා 9 කදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත එකතුව රු.102,662,700 ක ණයක් ලබාදී එම ණය මුදලින් රු.9,000,000 ක් වසරක් තුළදී පියවීමටත්, රු.93,662,700 ක් මහනුවර පිහිටි මහබේරියතැන්න වත්ත නමැති ඉඩම විකුණූ වහාම පියවීමටත් ගිවිසුම් ප්‍රකාරව එකඟ වී තිබුණි. එහෙත් එකඟවන අවස්ථාව වන විටදී ද බාහිර පාර්ශවයකට ඉඩම 99 අවුරුදු බදු දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය මුදල් ලබාදී වසර 20 ක් ගතවී තිබුණ ද නොපියවූ ණය ශේෂය රු.55,512,700 ක් සහ ඒ සඳහා උපචිත පොලිය රු.98,023,448 ක් විය. | මේවන විට රු.500,000 බැගින් මාසික වාරික නොකඩවා අයවේ. මේ සම්බන්ධයෙන් 2023 මාර්තු 17 දින පැවති ගොවීන්ගේ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාවට ලක් කළ අතර එහිදී මාසික වාරිකය රු.මි. 1 බැගින් ගෙවා අවසන් කරන ලෙස අදාළ ආයතනය දැනුවත් කරන ලදි. | නොපියවූ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 වර්ෂයේදී මාස 24 ක් තුළ අයකර ගැනීමට එකඟ වී රු.1,000,000 ක මුදලක් භාරකාර අරමුදල විසින් අනුමත කර ඉන් රු.500,000 ක මුදලක් අර්තාපල් බෝග වගාව සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි වලපන ග්‍රාමයේ ගොවියකු වෙත නිදහස් කර තිබුණි. එම පළාත භාර ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයා විසින් ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කර නොමැති බව වාර්තා කර තිබීම හේතුවෙන් ඉතිරි මුදල නිදහස් කර නොතිබුණු අතර වසර 6 ක් ගතවී ඇතත් ණය මුදල හා පොලිය අයකරගෙන නොතිබුණි. | මෙය ගොවි බැංකුව හරහා ලබා දී ඇති ණය මුදලකි. ගොවිජන විනිශ්චය සභාව විසින් නඩු පවරා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | එකඟවූ පරිදි මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | බඩඉරිඟු වගා කරන ගොවීන් වෙත ලබා දීම සඳහා 2020 වර්ෂයේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු රු.200,000,000 ක ණය මුදල සඳහා රු.1,655,819 ක් ලැබිය යුතු පොලිය ලෙස උපචිත කර තිබුණු නමුත් මේ දක්වා අය කරගෙන නොතිබුණි. | අදාළ ණය ශේෂය හා පොලී මුදල අයකර ගැනීමට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. | වාරික මුදල් සමඟ පොලී මුදල් ද අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිගින් දිගටම විගණනය විසින් පෙන්වාදෙන ලද පරිදි පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරා විහිදී ඇති කුඹුරු අක්කර 3,000 ක් Global Gap සහතිකකරණ ක්‍රමවේදයට අනුව 2018/2019 වගා කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතකරණ ක්‍රමවේද පිළිබඳ ගොවි ජනතාව දැනුවත් කිරීම හා පරිසර හිතකාමී තිරසර කෘෂිකාර්මික ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් ආර්ථික වාසි අත්පත් කර ගැනීම අරමුණු කර ගෙන පිහිට වූ රන් ගෙවිලිය සමාජ ව්‍යවසාය පොදු සමාගමට වසරක කාලයකින් ගෙවීමේ පදනම මත රු.5,966,000 ක පොලී රහිත ණයක් ලබා දී තිබුණි. ව්‍යාපෘති කාල රාමුව අනුව 2019 මාර්තු මස වන විට ගෙවිලියන්ගේ වී නිෂ්පාදනය වෙනුවෙන් GAP (Good Agriculture Practice) සහතිකය ලබා දීමට අපේක්ෂා කළද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සහතිකය ලබාදීමට කටයුතු කර නොතිබුණු අතර භාරකාර අරමුදල විසින් ලබා දුන් ණය මුදල අයකරගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නිරන්තර දැනුවත් කිරීම් කර ක්‍රියා කළ අතර යළිත් ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2023.03.17 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු කරන ලෙසට දන්වා ඇත. අදාළ නීතිමය කටයුතු සිදු කිරීමට නීති අංශය වෙත මේ වන විට යොමු කර ඇත. | සැලසුම් ප්‍රකාරව ගැප් සහතික නිකුත් කර, ණය මුදල පියවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල සහ ගොවි සමාගම් වෙත ලබාදී ඇති කෙටිකාලීන ණය ශේෂ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 ක සිට වර්ෂ 22 ක් දක්වා වූ කාල පරාසයක් ගතවී තිබුණු රු.27,360,493 ක් වූ ණයගැති ශේෂය අයකර ගැනීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | • රු.1,424,521 ක ශේෂය ගොවිජන විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.<br>• මුළු එකතුව රු.8,623,393 ක් වූ ශේෂ දෙකක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි කමිටුවක් පත් කර ඉදිරි කටයුතු කිරීමට යෝජිතය.<br>• රු.8,200,000 ක ශේෂයට අදාළ සමාගම් 3 කට එරෙහිව නීතිමය කටයුතු කිරීමට යෝජිතය.<br>• රු.9,112,579 ක ශේෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි කමිටුවක් පත් කර ඉදිරි කටයුතු කිරීමට යෝජිතය. | යෝජිත ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2002 වර්ෂයේදී චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කර ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේදී එම අරමුදල් දෙකෙහි පැවති හර හා බැර ණය ශේෂයන් ගොවීන්ගේ භාරකාර අරමුදලට පවරා දෙන ලදී. එහිදී අරමුදලට පවරන ලද චක්‍රීය අරමුදලේ රු.44,255,850 ක කෙටි කාලීන ණය ශේෂය අයකරගැනීම සඳහා 2014 වර්ෂයේදී රු.1,490,000 ක දීමනා ගෙවා විශ්‍රාමික නිලධාරීන් 10 දෙනෙකු පත් කර තිබුණු නමුත්, තවදුරටත් 2019 වර්ෂයේ සිට අයකර නොගත් ණය රු.39,909,275 ක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | චක්‍රීය අරමුදල් ණය ශේෂය නිරවුල් කිරීමට පත් කරන ලද නිලධාරීන් ලබා දුන් වාර්තාවල සඳහන් කරුණු පදනම් කර ගනිමින් රු.44,255,850 ක්ව පැවති ශේෂය රු.39,909,275 ක් දක්වා අඩු කරගෙන ඇත. නමුත් ඉතිරි ශේෂය සම්බන්ධයෙන් කමිටුවක් පත් කර නිරවුල් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. | ණය අයකර ගත යුතුය. |
| (ඈ) | පුද්ගලික සමාගමක් වෙත 2003 වසරේදී ලබාදී ඇති රු.3,500,000 ක ණය මුදලින් රු.860,000 ක්, සහ උපචිත පොලී වටිනාකම රු.676,666 ක් තව දුරටත් අයවීමට පැවතුණි. මෙම සමාගම ව්‍යාපාරික කටයුතු නවතා ඇති බව හා ණය මුදල ලබා ගත් පුද්ගලයා මිය ගොස් ඇති බව අරමුදල වෙත දැනුම් දී ඇති බැවින් තව දුරටත් ණය අයකරගැනීමේ හැකියාව පිළිබඳව සාධාරණ පරීක්ෂාවක් සිදු කර අයකර ගැනීමට හෝ අවශ්‍ය නීතිමය පියවර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2023.03.17 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කරන ලද අතර එහිදී නීතිමය කටයුතු සිදු කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසා බැලීමට තීරණය වී ඇත. ඒ අනුව නීති අංශය වෙත යොමු කර ඇත. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ලොකු ළූණු බීජ නිෂ්පාදනය කරනු ලබන ගොවීන් 63 දෙනෙකු සඳහා 2016 වර්ෂය වන විට රු.11,370,000 ක ණය මුදලක් ප්‍රදානය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයනොවූ ශේෂය රු.2,957,120 ක් වූ අතර එකඟව තිබුණු කොන්දේසි ප්‍රකාරව ණය මුදල අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | මෙය මාතලේ දිස්ත්‍රික්කය වෙත ගොවි බැංකු හරහා ලබා දී ඇති ණය මුදලකි. ගොවීන්ගෙන් මුදල් අයකර ගැනීමේ ප්‍රමාදවීම් හේතුවෙන් මෙය තවමත් අයවෙමින් පවතී. මේ වන විට රු.2,623,265 ක ශේෂයක් පවතී. | එකඟවූ පරිදි අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | වසරක් ඇතුළත අයකර ගැනීමේ කොන්දේසිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩඉරිඟු වගා කරන ගොවීන් 10,000 ක් වෙත ලබා දීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත රු.90,000,000 ක් 2015 වර්ෂයේදී ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 7 ක් ගත වී තිබුණද රු.16,541,332 ක ශේෂයක් අයවීමට පැවතුණි. | මෙය ද අනුරාධපුර දිස්ත්‍රික්කය වෙත ගොවි බැංකු හරහා ලබා දී ඇති ණය මුදලකි. ගොවීන්ගෙන් මුදල් අයකර ගැනීමේ ප්‍රමාදවීම් හේතුවෙන් මෙය තවමත් අයවෙමින් පවතී. මේ වන විට රු.16,541,332 ක ශේෂයක් පවතී. | එකඟවූ පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ක්‍රියාත්මක කිරීමට මුදල් උපයෝජනය නොකර භාරකාර අරමුදලේ මුදල් දිගින් දිගටම ස්ථාවර තැන්පතුවල සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ස්ථාවර තැන්පතුවල රු.465,000,000 ක් සහ භාණ්ඩාගාර බිල්පත්වල රු.90,420,510 ක් එසේ ආයෝජනය කර රු.72,762,442 ක පොලී ආදායමක් උපයා තිබුණි. | රටේ පැවති අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් නව ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීමට ගොවීන්ගේ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇති අතර එබැවින් ව්‍යාපෘති ක්‍රියාක්මක නොකරන ලදි. අරමුදල සතු මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය සිදුකර පොලී ආදායම් ඉපයුවද එම මුදල් නැවත අරමුදලේ සංවර්ධන හා ණය වැඩසටහන් සඳහා යෙදවීම් සිදු කරනු ලබයි. 2023 වර්ෂයේදී සංවර්ධන හා සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යෝජිතය. | අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1. ඡේදය මඟින් හඳුන්වා දී ඇති මු.රෙ.877(2)(ඉ) වගන්තිය ප්‍රකාරව අරමුදලේ 2021 වර්ෂයට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් මේ දක්වා එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයේදී මුද්‍රා ප්‍රකාශන සමග වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වීම. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරගත යුතු වුවත් භාරකාර අරමුදල විසින් අභ්‍යන්තර විගණක වරයෙකු පත්කරගෙන නොතිබුණි. | ගොවීන්ගේ භාරකාර අරමුදල කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනය විසින් විගණනයට ලක් කෙරේ. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය අරමුදලේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි. | අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරගත යුතුය. |